කඩුගන්නාව නගර සභාව

මහනුවර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජුනි 20 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව , කඩුගන්නාව නගර සභාවේ 2012දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපැම හැර 2012දෙසැම්බර් 31දිනට කඩුගන්නාව නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය අවසානයට හිග විශ්‍රාම වැටුප් ශේෂය රු. 1,255,072 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

## 2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,380,696ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,998,668 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 2,245 | 7,831 | 3,511 |
| (ii) | බදු කුලී | 3,131 | 3,287 | 923 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 875 | 1,002 | -- |
| (iv) | වෙනත් ආදායම් | 4,071 | 7,592 | 5,582 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 189,299 |
| (ii) | මුද්දර ගාස්තු | 5,355,080 |

2.2.3 හිග තානායම් ගාස්තු

සභාව සතු තානායම නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලංකා රෙස්ටුරන්ට් ලිමිටඩ් නමැති ආයතනයට බදු දී තිබූ අතර 2012 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළ තානායම් ගාස්තු රු. 500,500 ක් අය වී නොතිබුණි.

2.2.4 පරිසර බලපත ගාස්තු

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පවත්වන ලද රෙගුලාසි වලට අනුකූලව අංක 1533/16 දරන 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත ව්‍යාපෘති වෙනුවෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු වුවත් ව්‍යාපාර ආයතන 30 ක් සඳහා බලපත්‍ර ලබා නොගැනිම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. 231,000 ක ආදායමක් අහිමි වි තිබුණි.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

නාගරික සංවර්ධන හා පූජා භූමි අමාත්‍යවරයාගේ 2009 අප්‍රේල් 17 දිනැති හා අංක 1597/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ v වන උපලේඛනය අනුව සෑම ඉදිකිරිමක්/සංවර්ධන කටයුතු වෙනුවෙන් අනුකූලතා සහතික ලබා ගත යුතු වුවද, 2010 හා 2011 වර්ෂවලට අදාල ඉදිකිරිම් හා සංවර්ධන කටයුතු 83 ක් වෙනුවෙන් අනුකූලතා සහතික නිකුත්කර නොතිබුණි. මේ හේතුවෙන් අයකර ගත හැකි වරිපනම් ගාස්තු අයකර ගැනිමටද නොහැකි වි තිබුණෙන් සභාවට රු.352,590 ක ආදායමක් අහිමි වි තිබුණි.

3 පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය